## 2023-01-10 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
## මහා සභා රැස්වීම් වාර්තාව

**මෙදින පෙ.ව.10.00 ට පමණ මහා සභා රැස්වීම ආරම්භ වු අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති (වැ.බ) |
| 2. | ආර්.ධනරත්න මැතිතුමා | සභික |
| 3. | ඩබ්ලිව්. අශෝක ගුණරත්න මැතිතුමා | සභික |
| 4. | අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා | සභික |
| 5. | එස්.කරුණාදාස මැතිතුමා | සභික |
| 6. | එච්.සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 7. | ජී.එම්.දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා | සභික |
| 8. | මොහොමඩ් රාෆි මැතිතුමා | සභික |
| 9. | ආර්.ඒ.නන්දසේන මැතිතුමා | සභික |
| 10. | කේ.ගයානි ප්‍රියදර්ශනී කුමාරගේ මැතිණිය | සභික |
| 11. | එස්.එල්.ඩී.ශිරාන් සමරතුංග මැතිතුමා | සභික |
| 12. | එම්.ඒ.චානක විජේරත්න මැතිතුමා | සභික |
| 13. | එස්.එම්.සේනාධීර මැතිණිය | සභික |
| 14. | රසිකා වසන්ති සිරිවර්ධන මැතිණිය | සභික |
| 15. | ඩබ්ලිව්. තිලක් පුෂ්ප කුමාර මැතිතුමා | සභික |
| 16. | සනත් ප්‍රියන්ත සිරිසේන මැතිතුමා | සභික |
| 17. | **සුගත් හෙන්ඩ්‍රි හැන්ඩ්‍රිෂන් මැතිතුමා** | සභික |
| 18. | රේවතී නන්දා මැතිණිය | සභික |
| 19. | ඩබ්.වී.ඩබ්. ජේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 20. | එච්.ටී.තිලකරත්න මැතිතුමා | සභික |

නොපැමිණි,

| | | |
|---|---|---|
| 1. | ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා | සභික |
| 2. | ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා | සභික |
| 3. | ආරියවංශ පල්ලෙවෙල මැතිතුමා | සභික |
| 4. | ඩී.පී චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා | සභික |
| 5. | එච්.කේ. කුමුදු නිල්මිණී රේණුකා මැතිණිය | සභික |
| 6. | පී.යූ.සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය | සභික |
| 7. | මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා | සභික |
| 8. | කේ.ඒ.එන්.එන්. කස්තුරිආරච්චි මැතිණිය | සභික |
| 9. | යූ.එල් නුවන් මහේෂ් රත්නායක මැතිතුමා | සභික |
| 10. | කේ.ඒ.රසිකා අරුණකාන්ති මැතිණිය | සභික |

**01. ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා - ලේකම්**

**සභාපතිතුමා :-**

අද දින මහා සභාව වෙනුවෙන් සැපැමිණි ඔබ සියළු දෙනාම ඉතාම ආදරයෙන් පිළිගන්නවා. මුලින්ම ඇත්තේ ආගම සිහි කිරීමයි.

**01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

i. **2022-12-13 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව**

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

2022-12-13 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව මම ස්ථිර කරනවා.

විරෝධතා තිබෙනම් දැනුම් දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-13 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

i. **CLG/DE/2/2/1 හා 2022-12-29 දිනැතිව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් යොමුකරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ ලිපිය** සභාගත කරනවා.

**සභාපතිතුමා :-**

**එම ලිපියම නැවතත් 2022-12-30 දිනැතිව ලැබී තිබෙනවා. එම ලිපියත් සභාගත කරනවා.**

03. **ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන**

**ii.ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ ඒකාබද්ධ යාන්ත්‍රණය දෙවන කමිටු රැස්වීම පිළිබඳ ලිපිය** සභාගත කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
**කෘෂි කර්මාන්තය දියුණු කරනවා කිවුවාට රජයෙන් කිසිඳු සහනයක් නැහැ.තිබුණා නම් මීට වඩා සහල් නිෂ්පාදනය ඉහළටම යනවා. අද පාසල් දරුවන් ආහාර නොමැතිව ක්ලාන්ත වී වැටෙන තත්වයක් තිබෙන්නේ. ඒ සඳහා යම් පිළිසරණක් යොදනවා නම් වඩාත් සුදුසුයි කියා මම කියනවා. අපි සැම මන්ත්‍රීවරයෙක්ම කෘෂිකාර්මික වැඩකට යොදවමු.**

**සභාපතිතුමා:-**
**සියළුම මන්ත්‍රීතුමන්ලා එක්වී ඒ සඳහා අවධානය යොමුකර වැඩපිළිවෙලක් සකස් කරමු.**

04. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත**
05. **යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. **2022-12-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
2022-12-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

ii. **2022-12-15 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
2022-12-15 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-15 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iii. **2022-12-27 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
**2022-12-27 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව** සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම **සභාවට යෝජනා කරනවා.**

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-10-27 මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iv. **2022-12-30 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**2022-12-30 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සභාවට යෝජනා කරනවා.**

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-30 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

v. **2022-12-29 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම- ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**2022-12-29 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-29 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

vi. **2022-12-29 ප්‍රසම්පාදන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම- ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**2022-12-29 ප්‍රසම්පාදන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022-12-29 ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

VII.

**2023 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම-බෝපැත්ත පාරේ සිට විලේගොඩ විජයනායක විද්‍යාලයට යන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම - ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ටී.තිලකරත්න මැතිතුමා**

**සභාපතිතුමා:-**

**2023 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම-බෝපැත්ත පාරේ සිට විලේගොඩ විජයනායක විද්‍යාලයට යන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**
**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**
**එම මාර්ගය වර්ෂා දිනවලදී ජලයෙන් යට වී විජයනායක විද්‍යාලයේ දෙමාපියන් හා දරුවන් විශාල ලෙස අපහසුතාවයට පත්වෙනවා. එම නිසා එම මාර්ගය ජලයෙන් යට නොවන ලෙස සංවර්ධනය කිරීමට මම යෝජනා කරන අතරම එම මාර්ගය සකස් කර හිටපු සභාපතිතුමාගේ නමින් තිලක් රෝහණ ජයවික්‍රම මාවත නමින් එම මාර්ගය පිළිසකර කිරීමට මම යෝජනාවක් ගෙන එනවා. ප්‍රදේශවාසීන්ගේ අත්සන් වැනි දෙයක් අවශ්‍යනම් ඒ සඳහා ඉදිරිපත් කරනවා.**

**සභාපතිතුමා :-**

මාර්ගයේ නම සංශෝධනය කරනවා නම් මුලින්ම ඉල්ලීම් ලිපියක් ලැබිය යුතු වෙනවා. සියලුදෙනාගේම අත්සන් සහිතව පසුව එය සභා සම්මත කර ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අනුමත කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියත් සමඟ ගැසට් පත්‍රයේ පළ කෙරෙනවා.එම නිසා ඉදිරි සභාවකදී යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්න.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

**එම යෝජනා දෙකම නිවැරදි යෝජනා. එම කාණුව වතුර යාමට හැකි ක්‍රමවේදයකට සකස් කරනවානම් හොඳයි කියා මම යෝජනා කරනවා.**

**සභාපතිතුමා:-**
**කාර්මික නිලධාරී මහතා මගින් ඇස්තමේන්තුවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරනවා.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම-බෝපැත්ත පාරේ සිට විලේගොඩ විජයනායක විද්‍යාලයට යන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**viii. දිවුරුම්පිටිය වත්තට යන මාර්ගයේ පාලම අසල සිට කෝවිල දක්වා කොටස සංවර්ධනයකර ගැනීම-ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී මනෝරි සේනාධීර මැතිනිය**

**සභාපතිතුමා:-**

**දිවුරුම්පිටිය වත්තට යන මාර්ගයේ පාලම අසල සිට කෝවිල දක්වා කොටස සංවර්ධනයකර ගැනීම සඳහා මහ සභා අනුමැතිය** ලබාගැනීමේ යෝජනාව සභාවට යෝජනා කරනවා.

**සභික තිලක් පුෂ්පකුමාර මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභාපතිතුමා:-**
**මෙම යෝජනා දෙකම ඇස්තමේන්තු සකස්කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවනවා.**

**සභික සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා:-**
**මේ සම්බන්ධව අප පෙරත් යෝජනා කළා. මෙහි ගැටළුසහගත තත්වයක් තිබෙනවා. මෙය අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන මාර්ගයක් . මෙහිදී අපි මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෙම ඉල්ලීම කළ යුතු වෙනවා.**

**සභාපතිතුමා:-**
**අයිරෝඩ් ව්‍යාපෘතිය දැනට නතර වී තිබෙනවා.එය ප්‍රාදේශිය සභාව සතු මාර්ගයක්. දරුවන් අපහසුතාවයට පත්වන නිසා මේ සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරනවා.**

**සභික එස්.එම්.සේනාධීර මැතිනිය:-**
**2015 වර්ෂයේදීත් මෙම ව්‍යාපෘතියට මධ්‍යම රජයෙන් මුදල් ලබාගැනීමට නොහැකි වුණා. එම මාර්ගයේ යන්නම බැහැ. තාවකාලිකව හෝ විසඳුමක් ලබාදිය යුතුයි. ආණ්ඩුකාරතුමාට කියා හෝ සභාවෙන් හෝ දැනට පස් දමා සකසා දෙන්න. වැසි කාලයට බෝක්කුව අසලටනම් යාමටවත් නොහැකි තත්වයක් තිබෙන්නේ.**

**සභික සුගත් හෙන්රි හැන්ඩ්‍රිෂන් මැතිතුමා:-**
එතුමියගේ යෝජනාව ඉතා හොඳයි. පාසල් ළමුන් සපත්තු පවා ගලවා එම ස්ථානයෙන් ගමන් කරන්නේ. කොන්ක්‍රීට් යෙදීමට නොහැකිනම් තාවකාලිකව හෝ සකසා දෙන ලෙස මම යෝජනා කරනවා.

**සභික එස්.කරුණාදාස මැතිතුමා:-**
**මේ සඳහා පළාත් මාර්ග ඉංජිනේරුතුමාට ඉල්ලීමක් ඉදිරිපත් කරන්න කියන්න. එවිට එතුමා ඇස්තමේන්තුවක් සකස්කර අවශ්‍ය කටයුතු සිදුකරාවි.**

**සභාපතිතුමා :-**
**කඩිනමින් එම කටයුතු සිදු කරමු.**

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, දිවුරුම්පිටිය වත්තට යන මාර්ගයේ පාලම අසල සිට කෝවිල දක්වා කොටස සංවර්ධනයකර ගැනීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**IX. සැපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
සැපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව සභාවට යෝජනා කරනවා.

**සභික අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඩතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, සැපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**X. හිඳුරංගල පොදු සුසාන භූමියේ සුසානාගාරයක් සාදා ගැනීමට රුපියල් ලක්ෂ දහයක් ලබාදී එය ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම - ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.චානක විජේරත්න මැතිතුමා**

**සභාපතිතුමා :-**
**හිඳුරංගල පොදු සුසාන භූමියේ සුසානාගාරයක් සාදා ගැනීමට රුපියල් ලක්ෂ දහයක් ලබාදී එය ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික ඩබ්.වී.ඩබ්. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා:-**
**එම යෝජනාව මම ස්ථිර කරනවා. එය අත්‍යවශ්‍ය කාරණයක්. වැසි දිනවල භූමදාන කටයුතු සිදුකරන විට ජනතාව අපහසුතාවයට පත්වෙනවා.**

**සභික චානක විජේරත්න මැතිතුමා:-**
ගියවර එම ගොඩනැගිල්ල සෑදීමට මම ලක්ෂ 02ක් ඉල්ලා සභාවට සිදුකල යෝජනාව සියළුම මන්ත්‍රීතුමන්ලා අනුමත කර එය ලබා දුන්නා. එයට මුලින්ම ස්තුතිවන්ත වෙනවා. නමුත් ලක්ෂ02කින් එය සිදුකිරීමට නොහැකියි.එම නිසා ලක්ෂ 10 ක් ඉල්ලා සිටිනවා.හිඳුරංගල ගම විශාල ගමක්.එහි කනත්ත අක්කර ½ක් පමණ අපේම ඡන්ද දායකයින් නොදැනුවත්ව අල්ලා ගෙන තිබුණා. පසුව සභාව මගින් එය බෙදා වෙන්කර කම්බි ගසා තිබෙනවා.මෙහා කෙලවර සිට කි.මී.02ක් පමණ දුර හදිසියේ අවමංගල්‍යයක් සිදුව වලක් කැපීමට ගොස් වර්ෂාවක් පැමිණියහොත් යාමට ස්ථානයක් නැහැ.පාසලට හෝ නිවසකට දිව යා යුතුයි. එම නිවෙස්වල මිනිසුන් කැමැත්තක් නැහැ එසේ පැමිණෙනවාට.එම නිසා මෙය හැකි ඉක්මනින්ම සාදා ගැනීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
එම වුවමනාව වැදගත්. සභාවේ තිබෙන ආර්ථිකය මත තමා මෙම ගැටළු සියල්ලම ඇති වී ඇත්තේ. මන්ත්‍රීතුමා එය තේරුම්ගනීවි මම සිතන්නේ. මන්ත්‍රීවරයෙක්ට ලක්ෂ 10 බැගින් දුනහොත් සභාවේ ඉදිරි කාරණා සිදුකල නොහැකි වේවි. නමුත් හැකිනම් අපේ ප්‍රතිපාදන හෝ යොදවා එය සිදුකරනවානම් හොඳයි. අපේ මුදල් හෝ යොදවා එම කාරණාව ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා:-
අනුමැතිය දුනහොත් අදියර කිහිපයකින් හෝ සිදුකළ හැකි වේවි.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම්දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

ඒ අනුව, **හිඳුරංගල පොදු සුසාන භූමියේ සුසානාගාරයක් සාදා ගැනීමට රුපියල් ලක්ෂ දහයක් ලබාදී එය ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**xi. ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව 05වන බිල්පත් වටිනාකම ගෙවීම - (රු.3,495,854.74) - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
**ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව 05වන බිල්පත් වටිනාකම ගෙවීම - (රු.3,495,854.74) සඳහා වන යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
එහි වැඩ කටයුතු අංගසම්පූර්ණ වීද තිබෙන්නේ?

**සභාපතිතුමා:-**
මීට පෙර කොමසාරිස්තුමා සමඟ පැවති සාකච්චාවේදී කියා සිටි ලෙස ,අත්‍යවශ්‍යම අයිතමයන් 03ක් ඉටුකර දේහයක් ආදාහනය කිරීමට හැකි ලෙස සකසා තිබෙනවා.නමුත් තව ටයිල් ඇල්ලීමට,වැසිකිළිය සාදා ගැනීමට තිබෙනවා.ටයිල් එම අවස්ථාවේ සොයා ගැනීමටත් නොහැකිව තිබුණා. එම නිසා දැනට තිබෙන ආර්ථික අර්බුදයත් සමඟ එය පසෙකට තබා ,ප්‍රධාන අත්‍යවශ්‍ය කාරණය ඉටු වී තිබෙන බැවින් ,එය විවෘත කිරීමට 2023-01-30 දින සවස 3.36ට වේලාව සූදානම්කර තිබෙනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
මෙය අවසන් ගෙවීම නොවෙයි නේද?

**සභාපතිතුමා:-**
නැහැ.අපි මෙම ගෙවීම් සිදුකිරීමට ප්‍රථම නර්ඩ් ආයතනයට යවනවා. එහි සහතිකය ලැබී තිබෙන්නේ.
ඉන්පසු කොමසාරස්තුමාට,ප්‍රධාන ඉංජිනේරුතුමාට ඉදිරිපත්කර අවශ්‍ය සියළු කරුණු ඉටු වූ පසු තමා ගෙවීම් කටයුතු සිදුකරන්නේ.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
විරෝධතා තිබේනම්දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

ඒ අනුව, **ඇහැලියගොඩ විලේගොඩ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව 05වන බිල්පත් වටිනාකම ගෙවීම -(රු.3,495,854.74) සඳහා වන යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**6.** කාරක සභා වාර්තා

i. 2022-12-01 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
ii. 2022-12-15 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
iii. 2022-12-27 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
iv. 2022-12-30 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
v. 2022-12-29 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - ගරු සභාපතිතුමා.
vi. 2022-12-29 ප්‍රසම්පාදන කමිටුව - ගරු සභාපතිතුමා.
vii. කාර්මික සේවා කමිටුව - නොපැවැත්විණි.
viii. පරිසර හා පහසුකම් කමිටුව -නොපැවැත්විණි.
ix. විදුලිය,ජලය,රථවාහන නැවතුම් ,පදික වෙළඳාම පිළිබඳ උපදේශක කාරක සභාව - නොපැවැත්විණි.
x. සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව - නොපැවැත්විණි

**සභාපතිතුමා :-**
2023 වසරේ කමිටු සඳහා තේරීපත්වූ මන්ත්‍රීතුමන්ලා එම කමිටු සඳහා නොවරදවාම සහභාගී වන ලෙස විශේෂයෙන්ම මතක් කරනවා.අත්‍යාවශයම කරුණකට හැර සහභාගී නොවී ඉන්න එපා කියා මතක් කරනවා.

**සභික එස්.එම්.සේනාධීර මැතිනිය:-**
දිවුරුම්පිටිය පාරිසරික ගම්මානයේ අලුතින් ඉදිකර ඇති ව්‍යාපෘතිය නිසා දුමක් පැතිර යනවා.ඒ සඳහා පරිසර අධිකාරියෙන් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අවසර ලබාදී නැහැ.එයට ගන්නා පියවර කුමක්ද සභාපතිතුමනි?

**සභාපතිතුමා:-**
විරෝධතාවක් පැමිණි විට මමත් එම ස්ථානයට ගියා.අපහාසාත්මකව එක් අයෙක් කථා කළා.මහජන පීඩාවක් නම් අපට එය නතර කළ හැකියි. වහාම නවත්වන ලෙස දන්වා පොලිසියටත් සමඟ ලිපියක් නිකුත් කරන්නම්.

**7.** **ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා**

- ප්‍රා.ස.14 හා 16 (දෙසැම්බර් මස) මහා සභා අනුමැතියට යෝජනා කරමි.
- හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.

**සභාපතිතුමා :-**
ප්‍රා.ස.14 හා 16 (දෙසැම්බර් මස) , හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

එම යෝජනා මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබෙනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ප්‍රා.ස.14 හා 16 (දෙසැම්බර් මස) හා හිඟ ආදායම් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

08. **මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභාගත කිරීම.**

සභාපතිතුමා :-
**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ආරියවංශ මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මනෝජ් වෙලගෙදර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නුවන් මහේෂ් රත්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කුමුදු නිල්මිණි රේණුකා මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී රසිකා අරුණකාන්ති මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී නයනි කස්තුරිආරච්චි මැතිනිය**, 2023 ජනවාරි මස මහා සභාවට පැමිණිය නොහැකි බව දුරකථනයෙන්, දන්වා තිබෙනවා. එම නිවාඩු අනුමත කිරිමට යෝජනා කරනවා.

සභික එස්.එම්.සේනාධීර මැතිනිය:-

අද දින නොපැමිණි මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබෙනම් දන්වන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

ඒ අනුව, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ආරියවංශ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මනෝජ් වෙලගෙදර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නුවන් මහේෂ් රත්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කුමුදු නිල්මිණී රේණුකා මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රසිකා අරුණකාන්ති මැතිනිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නයනි කස්තුරිආරච්චි මැතිනිය**, 2023 ජනවාරි මස නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව සභා සම්මත විය.

**9. වෙනත් කාරණා**

- **පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

අපේ ප්‍රදේශයේ ක්‍රීඩා පිට්ටනියේ සංගීත සංදර්ශනයක් තිබුණා.එමගින් යම් කණ්ඩායමකට විනෝද ආශ්වාදයක් ලැබුණත්, ප්‍රදේශයේ පරිසරයට විශාල හානියක් සිදු වුණා. ප්‍රදේශයේ ඇල දොලවල් වල බියර් ටින්,කවර වලින් පිරී තිබුණා.එයින් හොරගොඩ පාරෙහි වලවල් ටික වැසීම නම් හොඳයි. නමුත් ඔවුන් උපක්‍රමශීලීව ඇහැලියගොඩ ජනතාවගේ මුදල් කෝටි ගණනින් එක්කාසු කරන් ගියා පමණයි.ඒ පිළිබඳව මාගේ කනගාටුව පළ කරනවා. සේවයක් නම් සිදු වූයේ නැහැ.සමහරු ළමයින්ට පොත් පත් රැගෙන දීමට ඇති මුදල් පවා දහස් ගණනින් මෙය නැරඹීමට වියදම් කළා. ඊළඟ කරුණ රෝහල්වල මේවන විට අත්‍යවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය නොමැති වී තිබෙනවා. සංගීත සංදර්ශන පැවැත්වූ අය රෝහල් වලට බෙහෙත් ,ළමුන්ට පොත් පත් හෝ රැගෙන දුන්නා නම් , එය ඉතාමත්ම වටිනවා. මෙයින් සභාවටද ආදායමක් නැහැ ,විශාල පරිසර හානියක් ප්‍රදේශයේ සිදුවෙනවාය කියා.අතිගරු ජනාධිපතිතුමාට,ගරු අග්‍රාමාත්‍යතුමාට, ප්‍රාදේශීය ලේකම්තුමාට,අපේ සභාපතිතුමාට මම දැනුවත්කර ලිපි ලිව්වා. එමෙන්ම දළදා වහන්සේට අගෞරව කිරීමක් පිළිබඳව අමරවංශ කියන පුද්ගලයෙක් පහත් ලෙස බෞද්ධාගමටද අගෞරවයක් වන ලෙස අදහස් **ප්‍ර**කාශකර තිබෙනවා. අපි බෞද්ධයන් ලෙස ජාති ආගම් කුළ බේද ඇති කරන පුද්ගලයන් නොවෙයි කියාත් මම මතක්කර සිටිනවා. අපි ආගම නිවැරදිව අදහන අය. මේ පිළිබඳවත් වරදවා සිතන්න එපා. කැබ් රථය හේවායින්න කළුඅඳුර **ප්‍රදේ**ශයට බීමත් පුද්ගලයෙක් බැස්සවීමට යනවලු.ඔබතුමා දැනුවත්ව ද නොදැනුවත්ද යන්නේ දන්නේ නැහැ. එසේ වෙනවා නම් සොයා බලන්න කියා ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා:-**

අපි මෙයට විරුද්ධව මිනිසුන් දැනුවත්කර යම් හඬක් නැගුවා නම්, මිනිසුන් කියයි ඇහැලියගොඩ අපිට බැලීමට ලැබෙන මේ දෙය අපි නැවැත්වීමට උත්සාහ දරනවාය කියා. කැබ් රථය සම්බන්ධයෙන්ද එලෙස සිදුවීමක් මෙතෙක් සිදු වී නැහැ.නිල රථය ලෙස මාහට ඇති බලතල අනුව මම එය භාවිතා කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

පසුගිය 07 වෙනිදා පළාත් සභාවට ගියා නමුත් පසුවදා ගරාජයට පැමිණ නැහැ.අම්බලන්ගොඩ නගරාධිපතුමා සේ සද්භාවයෙන් කටයුතු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

**සභාපතිතුමා:-**

එදින පළාත් සභාවට ගොස් පසුවදා තමා පැමිණියේ.රාජකාරී ගමනක් ගියේ.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

අවුරා ලංකා සැණකෙලියෙන් අපට කීයක් ලැබුණාද ? කැළි කසළ ඉවත්කිරීම සඳහා මුදල් ලැබුනාද? කියා දැනුවත් කිරීමක් අවශ්‍යයි.

**සභාපතිතුමා:-**

එදින සාකච්චාවෙන් පසු අපේ විමර්ශන නිලධාරීතුමියත් ගොස් තිබුණා එය නැරඹීමට . ඇයත් පවසා සිටියා අපට ලබාගත හැකි බොහෝ ආදායම් ඔවුන්ගේ කපටි ක්‍රියාමාර්ග හේතුවෙන් අවහිරකර තිබුණා. නමුත් අපේ දේපල ඔවුන් දන්සල සහ විවිධ අවශ්‍යතා සඳහා ඉල්ලුම්කර තිබුණා. අපි ඒ සියල්ලටම නීත්‍යානුකූලව අයකිරීම් සිදුකර ලබා දුන්නා. කැළි කසළ ඉවත්කිරීම සඳහාත් මුදල් ලබාදුන්නා.මෙම සභාවට ආදායමක් ගත්තා නම් එම සියල්ලම ලබන සභාවේදී ලිඛිතව ඉදිරිපත් කළ හැකියි. අදාල විෂය නිලධාරී හමුවී උනත් ලබාගත හැකියි.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

පසුගිය සභාවේදී මම ඉල්ලීමක් සිදුකළ නිසා තමා ඔවුන් සමඟ සාකච්චාවක් පවා පැවැත්වූයේ.

**සභාපතිතුමා:-**

අපි කලින් දැනුම් දී තිබුණා. නමුත් සමහරු නැති බව පවසමින් ඔවුන් එය කල් දැමුවා. පසුව අපි තදින්ම කියා සිටි නිසා තමා එදින සාකච්ඡාව පැවැත්වූයේ.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

සභිකයෙක් ලෙස මාහට පෙනෙන දෙය තමයි අපේ පනතේ හෝ අතුරු ව්‍යවස්ථාවේ හෝ යම්කිසි හිඩැසක් තිබුණා.මෙවන් අවස්ථාවකට කෙලෙසකද මුහුණ දෙන්නේ කියා අපි සියලුදෙනාම එක්වී අපේ පනතේ අඩුපාඩු සකසා හෝ අලුතින් අතුරු ව්‍යවස්ථා සකසා හෝ මේවාට මැදිහත් විය යුතු ආකාරය පිළිබඳව අලුතින් සිතිය යුතුයි.මේ වගේ සැණකෙලියක් වෙනවා නම් ප්‍රාදේශිය සභාව හරහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන මෙන්ද, සභාවට බදු අයකර ගන්නේ කෙලෙසද, මේවාට මැදිහත් වන්නේ කෙලෙසද කියන කාරණය මේ වෙලාවේ ඉගෙනගත් දෙයක් ලෙස හඳුන්වාදීමට කැමතියි.

**සභාපතිතුමා:-**
මෙයට අනුමැතිය අපිට දීමට හැකියාවක් නැහැ.ක්‍රීඩාපිටිය අයිති UD එකට. ජාතික පාසලේ වාර්තා වී තිබෙනවා සැණකෙළියක් තිබෙනවා කියා.එහි මේවන විට ටිකට්පත් අලෙවි කරනවා මුද්‍රාවත් නොතබා.මෙලෙස සිදුවීනුත් සිදුවෙනවා.

සභික තිලක් හොරගොඩ මැතිතුමා:-
ඔබතුමාට මඩ ප්‍රචාරයකුත් යනවා ලක්ෂ 30ක් ගත්තාය කියා.

සභාපතිතුමා:-
එය සාක්ෂි ඇතුව ඔප්පු කරනවා නම් මම මේ තනතුරෙනුත් ඉල්ලා අස් වෙනවා.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**
එදින සාකච්චාවේදී ඔවුන් පැවසුවා කිසිම සුදු ක්‍රීඩාවකට අවසරය ලබාදී නැති බව. නමුත් සෑම තැනම සූදුවක් තිබුණා. මෙහිදී ජනතාව අපෙන් විමසනවා මේ වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද කියා. මහජන නියෝජිතයන් ලෙස අපි ජනතාව කියනා දෙයට අහුම්කම් දී මේ වෙනුවෙන් යම් කිසි පිළියමක් යෙදිය යුතුයි.නැවත මෙවන් දෙයක් මෙම නගරයට එනවා. එහිදී කෙලෙසද මේවා පාලනය කරන්නේ කියා, අලුතින් පනතක් සාදා හෝ විසඳුම් සොයා ගත යුතුයි. නැතිනම් අනාගතයේ පත්වන මන්ත්‍රීතුමන්ලාත් අපහසුතාවයට පත්වෙනවා. මාහට පෙනෙනා ලෙසනම් මෙහිදී විගණන ප්‍රශ්නයක් ඉදිරියේදී මතු වේවි. එමෙන්ම වැකඩ උඩ කොටසේ කසළ රැගෙන නැහැ කියාත් මතක් කරනවා. අනෙක් කාරණය මැතිවරණ කොමිෂන් සභාව විසින් නාම යෝජනා කැඳවා තිබෙනවා ප්‍රාදේශිය සභා විසුරුවා නොහැර. ජනතාවට සහ අපිට මුහුණ දීමට සිදුව තිබෙන්නේ අලුත් දේශපාලන තත්වයකට. මන්ත්‍රීවරයෙක් ලෙස මාහට පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා. එනම්, සභාව විසුරුවා නොහැර නාම යෝජනා කැඳවීම තුළ. එහිදී යම්කිසි පාර්ශවයකට අවාසියක් සිදු වෙනවා.ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් කියා තිබෙනවා, යම් කිසි හෙයකින් දැනට බලය පවරා තිබෙන දේශපාලන කණ්ඩායම් අනිත් අයට අවාසිදායක ලෙස හැසිරුනහොත් මෙය මැතිවරණයට ඍජුව බලපානවා. එම නිසා මම මේ සභාවට කියන්න කැමතියි , අපගේ වටිනාකම් පිළිබිඹු කිරීමට,අනිකුත් පක්ෂවලට හානියක් සිදු නොවන ලෙස, සභාවේ කටයුතු කලොත් හොඳයි කියන අදහස, මෙහිදී ඉදිරිපත් කරනවා.එසේ සිදු නොවුනහොත් අපි ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් වෙත පැමිණිලි කිරීමට දෙපාරක් සිතන්නේ නැහැ.අනෙක් කරුණ මැතිවරණ කල් නොදමන ලෙස ඉල්ලා සිටිනවා. තවද ස්වාධීන මැතිවරණ කොමිසමක් කැඳවා ඡන්දය තියන්න බැරිද අහන්න ජනාධිපතිවරයෙක්ට බැහැ.එය වැරදි ක්‍රියාවක්. එමෙන්ම මම කියා සිටිනවා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රෙද්ශය තුළ වමේ පක්ෂ සියල්ල එනම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය,මහජන පක්ෂය,සම සමාජ පක්ෂය,කොමියුනිස්ට් පක්ෂය,ජාතික නිදහස් පෙරමුණ සන්ධානයක් ලෙස එක්වී අපි මැතිවරණයට මුහුණ දෙනවා., ඊලඟ මැතිවරණය තුළ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවක් අපි පිහිටුවනවා.

සභාපතිතුමා:-
කීයක් හරි නෙවෙයි. සැණකෙළියක් කළා කියලා අපට ඕන ඕන විදිහට මුදල් ගන්න බැහැ. පනත අනුව ගණන් හදලා දින ගණනට ගත යුතු මුදල කියනවා.

**සභික තිලක් පුෂ්පකුමාර මැතිතුමා:-**
සංගීත සංදර්ශනය නිසා ක්‍රීඩාපිටියට හානියක් සිදුවී ඇතිද කියා සොයා බලන්න කියා මම ඉල්ලා සිටිනවා. එමෙන්ම මාහිංගොඩ බෝමළුව පාර සම්බන්ධව ඉතා ඉක්මනින් විසඳුමක් ලබාදෙන ලෙසද ඉල්ලා සිටිනවා.

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**
දිලීන් මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කළා. බොහොම සතුටුයි. සභාව විසුරුවා නොහැර මැතිවරණයක් පැවැත්වීම කියන කාරණයේදී මට මතක් වෙනවා, උදාහරණයක් එතුමා ඒ කාලයේ නොසිටින්න ඇති. 1970 වසරේ රජය අවුරුදු 05න් මැතිවරණය නොතියා අවුරුදු 02ක් දීර්ඝ කළා. එහිදී එ.ජා.පක්ෂයේ නායක ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා දකුණු කොළඹ ආසනයේ මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වී,අතුරු මැතිවරණයකට ගියා. එවන් ආදර්ශමත් දෙයක් කරනවා නම් හොඳයි කියා මම කියා සිටිනවා. එමෙන්ම ඇහැලියගොඩ මැණික් සංස්ථාව ඉදිරිපිට වැසි දිනවලදී ජලයෙන් යට වෙනවා.එයට හේතුව, කාණුවට වඩා මාර්ගය පහළින් තිබෙන්නේ. එම නිසා RD එක දැනුවත්කර පාර සකස් කළ හැකි නම් ඉතා හොඳයි.තවද ධර්මපාල විද්‍යාලය අසල වංගුවේ ,කාණුවේ වලක් තිබෙනවා.එයද දරුවෙක් අනතුරකට පත්වීමට ප්‍රථම සොයා බලනවා නම් හොඳයි කියා මම ඉල්ලීමක් කරනවා. ආදාහනාගාරය විවෘත කිරීමට ගත් තීන්දුවටත් ස්තුතිවන්ත වෙනවා. තවද මම පෙර සභාවේ සිටියදී , විලේගොඩ බෝපැත්ත පාරේ දීගල්ල පාර ,එස්.අතුරලිය මාවත ලෙස නම් කරන ලෙස යෝජනාවක් ගෙන ආවා. එතුමා හොඳ වාමාංශික නායකයෙක්. එයට දේශපාලන අධිකාරියේද අනුමැතිය ලැබුණා. එමනිසා ඒ පිළිබඳවත් සොයා බලන්න කියා මම ඉල්ලීමක් සිදුකරනවා.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**
සභාවේ සභාපති ධූරය හිස්වී දැන් අවුරුද්දකට ආසන්න කාලයක් වෙනවා. නමුත් තවම මෙම ආණ්ඩුවේ බලධාරීන්ට ස්ථිර සභාපති තනතුරකට පත්කිරීමට නොහැකි වී තිබෙනවා. මම කියා සිටින්නේ ,ඔබතුමා හෝ

වෙනයම් කවුරුන් හෝ මෙහි සභාපති ලෙස පත්කල යුතුයි. මොකක්ද මේ පාලනය? ආණ්ඩුකාරතුමා එක එක චක්‍ර ලේඛන ගහනවා. කොමසාරිස්තුමා තව ඒවා ගේනවා. මේවා සම්බන්ධව අදාල වගකිව යුතු නිලධාරීන් දැනුවත් කල යුතුයි.දේශපාලන වාසි තකා අයාලයේ යාමට ඉඩ නොදිය යුතුයි.ඔබතුමා මෙය රැකගෙන සිටිනවා. කලිනුත් රැකගෙන ගියා. ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. නමුත් මෙම සභාව තුළ නීත්‍යානුකූල තත්වයක් තිබෙනවා.දෙවන කාරණය මැතිවරණය සම්බන්ධයෙන්. මම නම් දකින්නේ මෙය විජ්ජාවක් ලෙසයි.සභාපති පත්කල නොහැකි ආණ්ඩුවක් මැතිවරණයක් තියන්නේ නැහැ.නංගි පෙන්වා අක්කා දෙන වැඩක් මේ කරන්නේ.අපේ කොට්ඨාශයෙනුත් අපේක්ෂකයෙක් හොයනවා. මම දන්නවා අත්සනුත් කළා. මටනම් පොහොට්ටුව පිළිබඳ දුකක් තිබෙන්නේ. අපේ ලෙයින් දහඩියෙන් තමයි මෙය හැදුනේ. මෙය සෑදීමට විදි දුක දන්නේ අපි පමණයි.නමුත් අවසානයේදී මෙය අයාලයේ ගියා.පාලකයෙක් ,නායකයෙක් නැහැ කියන නීන භාවයටම පත්වුණා.ඒ පිළිබඳව මාගේ කනගාටුව ප්‍රකාශ කරන අතරම,එවලේ දේශපාලන වාසිය තකා ගන්නා තීන්දු තීරන නිසා තමයි මෙම සියළු කාරණා සිදුවන්නේ. නමුත් අපි මන්ත්‍රී ධුරය නැතිවෙයි ,ඊලඟ පාර ඒමට නොහැකි වෙයි කියා නොසිතා දේශපාලන වශයෙන් ගත යුතු තීන්දුව එවලේ ගන්නවා. ඡන්දය දුන් ජනතාව වෙනුවෙන් අපි කල දේවල් තිබෙනවා.ඔබතුමා සමඟත් පුද්ගලික තරහක් නැහැ. සියල්ල සිදු කරන්නේ ජනතාව වෙනුවෙන්. අපි සියලු දෙනාම සර්ව සාධාරණ මිනිසුන් නොවෙයි. නමුත් කාගෙවත් හෙන්වයියන් මේ සභාවට එවන්නේ නැතුව ස්වාධීනව කතා කරන්න පුළුවන්,ස්වාධීනව හැසිරෙන්න පුළුවන් මන්ත්‍රීවරු එයි කියා අපේක්ෂාවක් මාහට තිබෙනවා.අපේ කොට්ඨාශයෙනුත් හොඳ කෙනෙක් එනවා නම් අපි අත්දෙක උස්සා සහාය ලබා දෙනවා. නමුත් ඒ කෙනා කාගේ හෝ රෙදි සේදීමටනම් පැමිණෙන්නේ,කවුරුන් හෝ ආරක්ෂා කිරීමටනම් පැමිණෙන්නේ ,ජනතාව ආරක්ෂා කිරීමට නොවේනම් පැමිණෙන්නේ එයටත් මා විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මෙම ආර්ථිකය අර්බුදය තුළ ආර්ථික උත්පාදනය සඳහා අපේ රටේ ,ගමේ,නගරයේ කිසිඳු වැඩපිළිවෙලක් නම් පෙනීමටවත් නැහැ. ණය සහන කාලය ඉවර වූ දිනක,පෙට්‍රල් ෂෙඩ්වල පෝලිම් එන දිනක තේරුම් යාවි .ආණ්ඩුව ගැනනම් කිසිඳු විශ්වාසයක් නැහැ ජනතාවට. නමුත් තවමත් ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු හොරකම් කළේ නැහැ කියන මතයේ ජනතාව සිටිනවා. එම නිසා අපිවත් එක්ව රජයට බල කල යුතුයි මේ ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතියවත් ආරම්භ කරන ලෙස.අපේ සභාව මට්ටමින් හෝ අඩුම තරමේ ග්‍රාම සේවා වසම් 44ට හරක් ටිකක්වත් ගෙනත් දෙන ලෙස කියා සිටින්න. පතල් කර්මාන්තය කරගන්න අවශ්‍ය සහාය ලබාගන්න. නැතිනම් කම්පැනි මගින් ගමේ ඉඩම් අරන් ගමේ මැණික් ටිකත් අරන් යාවි .අද ඉපදෙන දරුවත් ණය කාරයෙක් වෙලා තිබෙන්නේ.එම නිසා මේවා සිදුකර ගැනීමට අවශ්‍ය සහාය ඉල්ලා සිටිනවා.

**සභික අශෝක ගුණරත්න මැතිතුමා:-**

පසුගිය 08 වෙනිදා අප නව ප්‍රදේශීය සභාවක් පිහිටුවීම සඳහා නාම යෝජනා බාර දුන්නා. කවුරුවන් හෝ කියා සිටිනවා නම් මෙහි වගකීම අපි බාර ගන්නේ නැහැ කියා එය බොරුවක්. ජයග්‍රහණයේ ලාභයට උරුමකම් කියනවා සේම පරාජයේ පාඩුවත් සාමූහිකව බෙදාගත යුතුයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා නොසිටින්නට කාටවත් මෙම ප්‍රාදේශීය සභාවේ හිඳ ගැනීමට ලැබෙන්නේ නැහැ. ඉහළ නායකයින් නැවත සන්ධානගත වුවහොත් පහළ සිටින අය සියල්ලන්ම ඒවි. එදිනට අපි ඒ ක්‍රමයට විරුද්ධය ඒ අයත් එක්ක නැතැයි කියන්න බැහැ. ඉතිහාසයේ කවදාවත් වාමාංශික කණ්ඩායම් එළියට ගිහින් ලබපු ජයග්‍රහණය නැහැ. වෙන් වූ වෙලාවේදී අපි සැමදාම පැරදී තිබෙනවා. එක්වූ වෙලාවේදී සැමදාම අප දිනලා තිබෙනවා. ඒ අනුව එක්වී අපි මේ රටට ලබාදුන් ජයග්‍රහණ වැඩියි, වෙන්වී අපි රටට අත්කර දුන් පරාජයන් වැඩියි.මේ රටේ වාමාංශික ඉහළ නායකයින් මොවුන් එපා කිවුවට එක් නොවී ඉන්නෙත් නැහැ.මොවුන්ට කියාවි බැරිනම් නිකන් සිටින්නට කියා.අපේ පොහොට්ටුවේ සමහරක් මන්ත්‍රීතුමන්ලාට බොහෝ කැපකිරීම් සිදුකර තමා මෙම ප්‍රාදේශීය සභාවට ඒමට හැකි වුණේ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන්. එක් අවස්ථාවක එය අපෙන් උදුරා ගිහින් වෙන තැනක එල්ලුවා.එයට අපි විරුද්ධ එළියට බැස්සා. එවිට අපේ නායකයා වූයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමාගේ සමඟ දේශපාන ගමන් මග අපි ශක්තිමක් කළා.එහි ලාභ පාඩු අපි විඳ දරා ගන්නා ගමන්,අසීරු අමාරුම අවස්ථාවකදී මෙය අතහැර යන ගුණමකු කමක් අපට නොමැති නිසා මේ ගමනත් අපි පොහොට්ටුවෙන් තරඟ කරනවා. අපි ඉතාම ශක්තිමත් කණ්ඩායමක් ඇහැලියගොඩ ප්‍රදේශීය සභාව වෙනුවෙන් පොහොට්ටුවෙන් ඉදිරිපත් කරනවා. අපි මෙම ප්‍රාදේශිය සභාවේ සිටියේ එකම ගහේ කුරුල්ලන් ලෙස. උඩ බලන් කෙළ ගසනවා මෙන් විවේචනයකින් තොරව සිටියොත් හොඳයි. නමුත් දැන් වුවත් හැකියාව තියෙයි අපි රාජපක්ෂලාගේ ගමන් මගේ නැතැයි කියා මෙතනින් ඉවත් වී පිටතට ගොස් වෙනම වැඩපිළිවෙලක් සකස් කිරීමට. එවිට අපිට පොහොට්ටුවේ ගමන් මග යන අය සමඟ ඉදිරියට යා හැකියි. එලෙස සිදුකරන්නෙත් නැහැ.බැන බැන ඉන්නවා. මෙය සිදුකරන්නේ එළියෙහි තිබෙන අරගල දේශපානයට ආමන්ත්‍රණය කිරීමට තමා. නොමැතිව ප්‍රතිපත්තියේ කිසිඳු වෙනසක් නොමැතිව නොවෙයි. පොහොට්ටුවේ මන්ත්‍රී කෙනෙක් නම් පොහොට්ටුවට විරුද්ධ නම් අයින් වන්න. -සභාව තුළ ඝෝෂාව - එමෙන්ම අවුරා ලංකා සිද්ධියේදී අපි මැදිහත් වූ ආකාරය ඉතාම දුර්වලයි. මම කියා සිටින්නේ අපි නිතරම සොයා බැලිය යුත්තේ ආදායමක් ලබාගන්න බැරි විදිහ නොවෙයි කෙලෙසද එයින් අපට යම් කිසි ආදායමක් ලබාගන්නේ කියා. මෙම ආයතනය යම් කිසි ආදායම් රැගෙන එය මෙම ප්‍රදේශයේ සුබ සිද්ධිය සඳහා යෙදවීමට අප බැදී සිටිනවා. එම වගකීම අප හරිහැටි ඉටු කළේ නැතැයි කියන කාරණය අප සැමටම පොදුවේ බෙදී යනවා. එම සැණකෙළිය සම්බන්ධව විවිධ මත තිබෙනවා. කැමති ආකාරයකින් එදෙස බැලිය හැකියි. අරමුණ කුමක් වුවත් ජනතාවගේ වින්දනය සම්බන්ධව යම් සාර්ථක දේවල් ප්‍රමාණයක් තිබුණා. නමුත් එම ගුණාත්මක දේවල් තුළ අපටත් යම් දෙයක් ලබාගැනීමටත් අවස්ථාව තිබුණා.එයට සභාවක් ලෙස අප මැදිහත් නොවුනාය කියන අදහස ,අපි සියලුදෙනාගේම කාර්යභාරය නිසි ලෙස ඉටු නොවුනාය කියන කාරණය මා කනගාටුවෙන් වුවත් කිව යුතුයි. ඔවුන් දන්නේ නැහැ ප්‍රාදේශිය සභාව කියා ආයතනයක් තිබේදවත් කියා. එමෙන්ම අපිට තිබූ මහජන ක්‍රීඩාංගනයේ තමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇහැලියගොඩ පොළ ඉදිකළේ. පසුව එම පොළ ඉදිකල භූමිය වෙනුවට නැවත ක්‍රීඩාංගනයක් සාදා දෙනවාය කියා එකල පැවසුවා. නමුත් එම ඉදිකල ක්‍රීඩාංගනය නාගරික සංවර්ධන අධිකාරිය සතු වෙනවා. එය නැවත ප්‍රාදේශිය සභාවේ මහජන ක්‍රීඩාංගනය ලෙස පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට ඔබතුමාගේ මැදිහත්වීම මම ඉතාම ගෞරවයෙන් බලාපොරොත්තු වෙනවා.ඒ සඳහා ඉල්ලීමක් කරනවා. පිටතට පෙනෙන සුන්දරත්වය සැණකෙලියේ තිබුනේ නැහැ. වැඩිම ප්‍රමාණයක් තිබුනේ සූදුව. ජන මනස එදෙසට යොමු වුණා. විශාල මුදල් ප්‍රමාණයක් ඔවුන්ගේ වැය වුණා. දුප්පත් මිනිසුන් තම කර මාල පවා උගස් තැබුවා. මාස ගණනක

දරිද්‍රතාවය ඉදිරියේදී මෙය බලපානවා. එක් ආකාරයකින් මෙය තායිලන්තය හා සමානයි. අපේ සංස්කෘතියට සිදු වූ හානියද අශෝබනයි. නමුත් එළියට ගොස් මේ පිළිබඳ කතා කළොත් බැනුම් ඇසීමට තමා සිදුවන්නේ. එම නිසා අප කණ්ඩායමක් ලෙස මීට වඩා ඉදිරියේදී අපි ශක්තිමත් වෙමු. මැතිවරණය සම්බන්ධයෙන්ද කිව හැක්කේ රටෙහි තිබෙන ආර්ථිකයත් සමඟ මිනිසුන් සිටින්නේ දැඩි අපහසුතාවයෙන්. නමුත් නීත්‍යානුකූව කාලසීමාව උදාවී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ශක්තිමත්ව මෙම ආර්ථිකය මෙහෙයවනවා, එම නිසා මෙම අවස්ථාවේ මැතිවරණයක් පවත්වනවාට වඩා රට ආර්ථික ලෙස ශක්තිමත් කිරීම ඉතා හොඳයි.

සභාපතිතුමා:-

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව සිදුකර ගැනීම සඳහා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ,මන්ත්‍රීතුමියන්ලා සහයෝගය ලබාදුන්නා. අවුරා ලංකා සමාගමේ නායකත්වය ගෙන කටයුතුකල එම පුද්ගලයා පුදුමාකාර කපටිකමක් තිබෙන අයෙක්. කොන්ක්‍රීට් කරදෙනවාය කියූ පාර නිකන් ශුද්ධකළා මම බලකල නිසා.ගේට්ටුව සාදා දෙනවාය කිවුවාට එය කළෙත් නැහැ.වැසිකිළි පද්ධතිය සෑදීමේදී ලේකම්තුමාත් මමත් දැඩි ලෙස මැදිහත් වුණා. එම නිසා කෙසේ හෝ සාමාන්‍ය මට්ටමකට එය සාදාගත හැකි වුණා. මින් ඉදිරියට මෙවන් කටයුත්තක් සිදු කිරීමේදී ඔබතුමන්ලා පැවසූ ලෙස අප සියලුදෙනාගේම මැදිහත්වීම විය යුතුයි කියන අදහස අප තුළ තිබෙනවා.සමාජය තුළ විවිධ මත පැතිර ගොස් තිබුණා. නමුත් මා ඇතුළු කිසිඳු මන්ත්‍රීවරයෙකුට කිසිඳු සන්තෝෂමක් ලැබී නැති බව මා මතක් කරනවා. ඒ අයට වාසි ලැබෙන තැන් වලට සල්ලි බෙදලා තිබෙනවා . මෙය අවසන් වූ දාට පසුදා මට කතා කර එම මහතෙක් කිවුවා කසළ ඇප තැන්පතුවේ ඉතුරු මුදල් ආපසු ගැනීමට. මම පැවසුවා විදුලි බිල පැමිණි පසු එය ලේකම්තුමා හා කාර්මික නිලධාරී මහතා සමඟ සාකච්ඡා කර ගන්නා ලෙස. ඉදිරියේදී සංවර්ධන කටයුතු, තිබෙන නීති රීති වලට එකඟව අත්‍යවශ්‍ය කාරණා වෙනුවෙන් සිදුකල යුතු වෙනවා. පොත් ලබාදීමත් විනිවිද භාවයෙන් යුතුව සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. අවශ්‍ය කරුණු වෙනුවෙන් විමසීමෙන් සිටින්න.වගකීමෙන් අපේ යුතුකම් මිනිසුන් වෙනුවෙන් ඉටුකරමු. ඔබතුමන්ලාගෙන් ලැබෙන සහායට නැවතත් ස්තුතිවන්ත වෙනවා. ,ඔබ සියළු දෙනාටම සුභම සුභ අනාගතයක් පතමින්,අදට නියමිත සභා රැස්වීම මින් නිමා කරනවා. දැන් වේලාව ප.ව.12.00 යි.

රුවන් ලියනගේ,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.